

# අනුරාධපුරයෙන් පසු.....

අපි ලබන සෑම යුධ ජයග්‍රහනයක් පිටුපසම පරාජයේ සෙවනැල්ලක් ඇත. ඒ බව සනාත වන්නේ දැඩි නිහඬතාවයකින් පසු කොටින් විසින් අනුරාධපුර ගුවන් හමුදා මූලස්ථානයට එල්ල කළ මරාගෙන මැරෙන ප්‍රහාරයෙනි. රුපියල් මිලියන ගණනක අලාභයක් කරමින් ගුවන් හමුදා හටයන් කීපදෙනෙකු ද විනාශ කරමින් ඔවුන්ද විනාශවෙමින් කළ මේ මහා විනාශයේ වගකීම ගුවන් හමුදාවට භාරගත යුතුයැයි මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යවරයා ප්‍රකාශ කර ඇත. කුමක් හෝ සිදුවීමකින් පසු මලකෝලමුන් බවට පත්වන අමාත්‍යවරුන් සිටින අපේ රටේ මෙයද එක්තරා දෙකේ පන්තියේ විහිලුවක් බව ඔහු නොදන්නවාට ජනතාව හොඳින් දන්නා බව අපි දනිමු. එයට හේතුව වන්නේ අපේ රටේ මෙතෙක් සිදු වූ සියලු ව්‍යසන වල වගකීම ඔවුන්ගේ පරපුරේ දේශපාලන බකතපස් ලා භාරගත යුතුවන හෙයිනි.

මේ සටනේදී කොටින් විසින් කුඩා හෙලිකොප්ටර් යානා යොදවා ද බෝම්බ හෙලා ඇති බව ඔවුන් ප්‍රකාශ කරන අතර එම හෙලිකො-ප්ටර්, ගොවිපලවලට කෘමිනාශක ඉසින හෙලිකොප්ටර් වන බවද ඔවුන්ම ප්‍රකාශ කරයි. එසේනම් ටොන් ගණන් බරැති බෝම්බ ගෙනැවිත් එම හෙලිකොප්ටර්වලට කඳවුරු විනාශ කළ හැකිද? ඇත්තෙන්ම මෙම ගමනේදී කොටිනගේ හෙලිකොප්ටර් ඉහළින් පියාසර කර ඇත්තේ කඳවුරේ සිටින හටයින් බියවැද්දීමට මිස බෝම්බ හෙලීමට නොවන බව දැන් සනාථ වී ඇත. සම්පූර්ණ විනාශයම කර ඇත්තේ කොටි පාබල හමුදාව විසින් බව දැන් හෙළිදරව්වන කරුණු වලින් පෙනීයයි. දැන් යුද්ධයේ අලුත් මුහුණුවර වන්නේ අපි කොටින්ගේ නැව් ගිලින විට උන් අපේ මිග් හෙලිකොප්ටර් ගිලින තත්වයට පත්වීමයි.

කොටීන්ගේ මූලික ඉලක්කය වී ඇත්තේ රටේ ආර්ථිකයයි. ඔවුන් මේ දිනවල තම අරමුණු සාර්ථක කරගන්නට යන්නේ සංචාරක ව්‍යාපාරය හරහාය. යාල අභය භූමියට එල්ල කළ ප්‍රහාරය එයට කදිම නිදසුනකි.

මේ යුද්ධය ජය ගැනීමට නම් නවීන අවි ආයුධ අවශ්‍ය බව ජනතාවට කී රජය මිලියන ගණන් මුදල් වියදම් කර, ජනතාවගේ බඩට මිසයිල යවා ලබාගන්නා අවි ආයුධ මෙවැනි සරල අන්දමින් තොත්ත බබාලා මෙන් බිලි දෙන්-න් නම් රටට සිදුවන්නේ කුමක්ද?

රුසියාවේ නිශ්පාදිත නවීන යුධ උපාංගවලින් පරිපූර්ණ ඇලිගේටර් වර්ගයේ මිග් යානාවක් පිළිබඳ විස්තරයක් මම පුවත් පතක පළ වී තිබෙනු දුටුවෙමි. එයින් එම ලේඛකයා අදහස් කර තිබුණේ මෙවැනි යානාවක් තිබුණානම් අද යුද්ධය අවසන් කළ හැකි බවය. ඇය එයින් ප්‍රකාශ කර තිබුණේ චෙච්නියානු ගරිල්ලන්ට විරුද්ධව රුසියානු හමුදාව මෙම යානය පාවිච්චි කළ බවත් සැනෙකින් නිවැරදි ඉලක්කයට පහර දී සියලුම සතුරන් විනාශ කළ බවත්ය. එම බොළඳ ලිපිය පිළිබඳව මට පැවසිය හැක්කේ එක දෙයකි. කෙතරම් උඩින් පියාසර කර පහර දුන්නත් එය ගොඩබිමට බා නිසි ලෙස පරිස්සම් කර ගැනීමට නොහැකි නම්, එක දවසින් අවසන් වන යුද්ධය නිමා කිරීමට තවත් වසර සිය ගණනක් යන බවය.




එසේම චෙච්නියානු ගරිල්ලන් සම්පූර්ණයෙන් විනාශ නොවුණු බවත්, තවමත් චෙච්නියාවල ගරිල්ලන් ජීවත්වෙන බවත්, කෙතරම් නවීන අවිආයුධ යොදාගෙන අමෙරිකාව ඉරාකයට පහර දුන්නත් තවමත් ඉරාකයේ මෙන්ම ඇෆ්ගනිස්තානයේද ගරිල්ලන් සිටින බවත්, තාක්ෂණයේ පිහිටෙන් ගරිල්ලන් මර්දනය කලත්, විනාශ කළ නොහැකි බවත් මේ ලිපියෙන් ප්‍රකාශ කළ හැක.

ඊළඟට රජය අත තබා ඇත්තේ මාධ්‍යයටයි. ඒ යුද්ධය පිළිබඳ විකෘති වාර්තා මාධ්‍යය තුලින් හෙළිකලා යන්නෙන් චෝදනා කොට පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවල බලපත් අහෝසි කිරීමයි. අපේ රටේ රජයේ මාධ්‍යයන් මෙන්ම පෞද්ගලික මාධ්‍ය ව්‍යාපාරද තමන්ගේ වගකීම් හරිහැටි ඉටුනොකරන්නේ අද ඊයේ සිට නොවේ. මාධ්‍ය පිළිබඳව කථා කිරීමේදී යුද්ධයට වඩා භයානක ලෙස අපේ දරු පරපුර විනාශ කරන මාධ්‍යයන් රටේ අද බිහි වී ඇත. උදේ සිට රෑ වනතුරු ඔවුන් කරන්නේ ජනතාවගේ ඉහමොල විනාශ කරන එකය. ඉහමොල විනාශ වී පිස්සු නටන .ටෙලි ටබීස්. දේශපාලනතුමන්ලාට ඒවා නොපෙ-නෙන්නේ තම පැවැත්මට හා ගසා කෑමට එයින් හානියක් සිදුනොවන නිසාය. එනයින් සලකා බැලුවහොත් අද අපේ රටේ සියලු මාධ්‍යය තහනම් කළ යුතු වේ. සියලුම දේශපාලන මහත්වරුන් ඉල්ලා අස්විය යුතු වේ. ඔවුන් තවමත් සිතා සිටින්නේ මාධ්‍යයක වගකීම වන්නේ බලයට පත් රජයක් මොන වැරැද්දක් කලත් ආරක්ෂා කල යුතුය යන්නය. විපක්ෂය සිතා සිටින්නේ පවතින රජය විවේචනය කල යුතුය යන්නය. ඒ නිසා බලයට පත්වන සෑම එකෙක්ම මාධ්‍යය පසු පස හඹා යයි. මාධ්‍යයක් පිළිබඳව නොදැන මුදලට මාධ්‍ය හසුරුවන එවුන් කරන්නේ .වාසි පැත්තට හෝයියා. කීමය. මේ සෑම දෙයකින්ම පාඩුව සිදුවන්නේ අහිංසක ජනතාවටය.

ඊළඟට අපි යුද්ධය දෙස නැවත හැරී බැලුවොත්, කොටීන්ගේ මීළඟ ඉලක්කය කුමක්ද? මිනිස් බිලි සිය ගණනක් හෝ බිලි දී තම අරමුණු ඉටුකරගන්නා කොටීන්ගේ මීළඟ ඉලක්කයෙන් අපි ගැලවෙන්නේ කෙසේද? දේශපාලන උතුමන්ලාගෙන් ඇසුවොත් නම් අපට මෙයට පිළිතුරු දහසක් පමණ ලබාගත හැකිය. ඔවුන් කොටීන් අනාගතයේ කරන්නට හදන සියලුම සැලසුම් දනී. එහෙත් සති කිහිපයක් ගිය පසු අපි දැන දැනත් සැලසුම් වලට අසු වී හමාරය. අනුරාධපුර ගුවන් හමුදා මූලස්ථානයට කොටි පහරදීමට සැලසුම් කර ඇති බව දැන දැනත් එය බිලිදුන්නේ ඒ නිසාය. යුද්ධයක් ජයග්‍රහනය කිරීමට අවි ආයුධ සේම මොළයද අවශ්‍ය බව නොදන්නාකම්-න් අපි අපේ සම්පත් ඔවුන්ට බිලි දී අවසන්ය.

මේ සියලු කාරණා සලකා බැලීමේදී අශ්වයන් හා හාල් නැලියක් උපමාවට ගෙන කර්මාන්තය කළ තණ්ඩුල නැලි ජාතකයෙන් අපට වැදගත් පණිවිඩයක් දෙයි. එහි කථාවේ තක්සේරුකමෙන් දේශපාලන උතුමන්ලා සිටින අපේ රටේ, ඔවුන් මුලු රටම කැඳ හැළියක් බවට පත් කරමින් සිටී. එම ජාතක කථාවෙන් අපිට ලබාදෙන උපදේශය නම් .තමන්ට නොහැකි සහ තමන් අසමර්ථ කටයුතු භාරගන්නා උදවිය තමන්ටත්, අනුන්ටත් අයහපතක්ම ලඟා කර දේය. යන්නය. ඇත්තෙන්ම අද සිදුවන්නේ එයයි.

5 වන පිටෙන්




පවතියි ද? අනෙක මේ උන්මාදය අපට අලුත් දෙයක් ද? අද සුපිරි තරු වටා රොක් වෙන රසිකයන් වගේම තමයි එදා රුක්මණී දේවිලා ස්ටැන්ලිලා එඩී ලා වටේ රසිකයන් රොක් වුණේ. එදා ජෝතිලට මිල්ටන්ලට එම එස්ලට වේදිකාවෙන් බැහැලා නිදහසේ යන්නවත් රසිකයෝ ඉඩ දුන්න ද? ගාමිණී විජේ ජෝ මාලිනී පීචා සන්ධ්‍යා වටේ රසිකයන් රොද බැඳගත්තෙ නැද්ද? ඒ උන්මාදය නිසාම නේද අපේ සිනමාව ගීත කලාව රැකුනේ? ඉදිරියට ගියේ ? එදා තරුවක අස්සනක් ගන්න පත්තරයක් සමරු පොතක් දික් කරපු රසිකයෝ අද සුපර් ස්ටාර්ලගේ අස්සන ගන්න පපුව විවෘත කරලා දෙන්න පෙළඹිලා. වෙනස් වෙලා තියෙන්නේ කාලය හා ක්‍රමය විතරයි. සැබෑ ලොවේ අපි කතා කළ යුත්තේ මේ උන්මාදය ගැන නොවේ. දක්ෂතාවෙන් ඉදිරියට ඒම වලකා ජනප්‍රියතාවෙන් ධනයෙන් බලයෙන් ඉදිරියට ඒමට ඉ ඩසලසා ඇති මේ ක්‍රමය ගැනයි.

සුනාමියෙන් අනාථ වුන දහසක් මිනිසුන් දුක් විඳින රටක යුද්ධයෙන් අනාථ වී උන් හිටි තැන් අහිමි වූ මිනිසුන් සිටින රටක සුපර් ද්ටාර් තරගයෙන් දෙවෙනි තැන ගත් තරග කරුවා ට ලක්ෂ 50ක වාහනයක් අරගෙන දෙනතරමට මිනිසුන්ගේ මානසිකත්වය හැඩ ගැසුනේ කෙලෙස ද? මේ දේ එක වරම සිදුවුණ දේ නොවේ. කාලයක් තිස්සේ හුරු කරගෙන ආව දේ වන ප්‍රතිඵල අපි දැන් විඳිනවා. රටේ ප්‍රධාන පුරවැසියාත් දෙවෙනියාත් නිදිවරාගෙන තරග බලන තත්වෙට වැටිලා නම් මොන කතා ද? අපි සිරසට අකැමැති වුනත් දොස් කියලා වැඩක් නැහැ. සිරස ප්‍රබුද්ධ විදිහට කලාව විකුනනවා. කවුරුත් දොස් කියන්න පෙළඹෙන්නෙ නැහැ. සුපර් ස්ටාර්ස්ලට පිලිතුරු ලෙස රූපහාහිනිය හා ප්‍රවීණයන් එකතු වෙලා ඇරඹූ රජත රශ්මි වලට සිදුවුනේ කුමක් ද? ඉතින් මිනිස්සු සිරස වටේ රොක් වෙන එක පුදුමයක් නෙවෙයි. අපි නම් හැමදාම කියන්නේ පුම්බා උඩ අරින දේ ඉතා ඉක්මනින් බිම වැටෙන බවයි. 2006 සුපර් ස්ටාර්ස්ල ගැන දැන් අහන්නවත් තියෙනවද? ජනප්‍රියතාව හා දක්ෂතාව අතර වෙනස එයයි. තරගය හා එහි ද්වභාවය ගැන ප්‍රශ්න ඇතත් දක්ෂතා ඇති නවකයන් රැසකට දොරගුලු විවෘත කර දීම නම් අගේ කල යුතුයි.








